# මැතිවරණ කොමිෂන් සභාව

## තනතුරු පුරප්පාඩු

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල පහත දක්වා ඇති පරිදි පුරප්පාඩු වී පවතින සංවර්ධන නිලධාරි සේවයේ තනතුරු සඳහා දැනට මධ්‍යම රජයේ සේවයේ නියුතු සංවර්ධන නිලධරයන් ස්ථිරව ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

| අනු අංකය | කාර්යාලය | සංවර්ධන නිලධාරි තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පුත්තලම | 02 |
| 02 | ගම්පහ | 02 |
| 03 | මාතර | 01 |
| 04 | මන්නාරම | 01 |
| 05 | නුවරඑළිය | 02 |
| 06 | කිළිනොච්චිය | 01 |
| 07 | කොළඹ දිස්ත්‍රික් | 01 |
| 08 | කොළඹ නාගරික | 01 |
| 09 | මඩකලපුව | 01 |
| 10 | බදුල්ල | 01 |
| 11 | පොළොන්නරුව | 01 |
| 12 | ත්‍රිකුණාමලය | 01 |
| 13 | අම්පාර | 01 |
| 14 | කුරුණෑගල | 01 |
| 15 | මැතිවරණ මහලේකම් කාර්යාලය | 07 |

**පොදු කොන්දේසි,**

I. මධ්‍යම රජයේ සේවයේ නියුතු රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 යටතේ බඳවා ගෙන සංවර්ධන නිලධාරි සේවයේ ස්ථිර පත්වීම් ලද නිලධරයෙකු විය යුතු ය.

II. පරිගණක භාවිතය පිළිබඳ අවබෝධය හා ත්‍රිභාෂා දැනුම

III. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

IV. රාජ්‍ය සේවය තුල මනා පැවැත්මකින් යුතුව සේවයේ යෙදෙන නිලධාරියෙකු විය යුතු ය.

V. ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 1.1 අනුව මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් හට දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකමක් නොමැත.

VI. අයදුම්කරුගේ පවුලේ සාමාජිකයෙකු හෝ කලත්‍රයාගේ පවුලේ සාමාජිකයෙකු ක්‍රියාකාරි දේශපාලන කටයුතු වල යෙදී නොමැති/ නොයෙදෙන තැනැත්තෙකු විය යුතු ය.

VII. මැතිවරණයක් පවතින කාල සීමාව තුළ සාමාන්‍ය රාජකාරී වේලාවට අමතරවද සති අන්ත සහ රජයේ නිවාඩු දිනවලද රාජකාරි ඉටු කිරීම කළ යුතු ය.

VIII. මැතිවරණ කොමිෂන් සභාවට ස්ථාන මාරුවීම් ලබා පැමිණීමේදී නිලධාරියාගේ මූලික වැටුපෙන් 25% ක අමතර දීමනාවක් මාසිකව ගෙවනු ලැබේ.

**<u>ඉල්ලුම් කල යුතු ආකාරය</u>**

ඒ අනුව ස්ථාන මාරුවීම් ලබා පැමිණීමට කැමති නිලධරයන් ඒ සඳහා වූ ඉල්ලීම් ලිපියක් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව මැතිවරණ **කොමසාරිස් ජනරාල්, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය,** යන ලිපිනයට එවිය යුතු ය. එලෙස ලැබෙන ඉල්ලීම් අනුව අදාල නිලධරයන් මැතිවරණ කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය වන්නේ ද යන්න පරීක්ෂා කර බැලීමෙන් පසු, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

<u>සටහන</u>

අනුප්‍රාප්තිකයෙකු රහිතව හෝ පසුව ලබා ගැනීමේ පදනම මත ඉදිරිපත් වන ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

**2024** මැයි මස 04... දින
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.